



# කුඩුකාරයන්ට ස්ත්‍රී දූෂකයන්ට වංචාකරුවන්ට නාම යෝජනා එපා

## මල්වතු-අස්ගිරි මහ නාහිමිවරුන්ගෙන් සියලුම පක්ෂවලට නිවේදනයක්

▶ 2 පිටුවට

# කුඩුකාරයන්ට...

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, අපරාධකරුවන්, ස්ත්‍රී දූෂකයන්, වංචාකරුවන්, සොරුන් ඇතුළු සමාජ විරෝධී හා නීති විරෝධී ක්‍රියාවන්හි නිරත වන හෝ නිරත වූ පුද්ගලයන්ට නාම යෝජනා ලබා නොදීමට සියලු පක්ෂ නායකයන් පියවර ගත යුතු බවත් යහපත් වූ දේශපාලන සංස්කෘතියක්, රටේ ස්ථාපිත කිරීමේ වගකීම සෑම දේශපාලන පක්ෂයකටම අනිවාර්යයෙන්ම පැවැරෙන බවත් මල්වතු හා අස්ගිරි මහ නාහිමිවරු දෙනම අවධාරණය කරති.

මෙරට යහපත් දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ මූලික පියවරක් වශයෙන් නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය විසින් සකස් කරන ලද 'මාර්තු 12 ප්‍රකාශනයට අස්සන් තැබීමෙන් අනතුරුව මල්වතු - අස්ගිරි මහ නාහිමිවරු මේ බව සඳහන් කළහ.

ඉදිරි මැතිවරණවලදී අපේක්ෂකයන් හට නාම යෝජනා ලබා දීම සඳහා දේශපාලන පක්ෂ සලකා බැලීමට එකඟ වූ මාර්තු 12 නම් වූ ප්‍රකාශනයේ අඩංගු කරුණු සම්බන්ධව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඇතුළු නියෝජිත පිරිසක් මහ නාහිමිවරුන් දැනුවත් කිරීම හා ප්‍රකාශනය සඳහා උන්වහන්සේ දෙනමගේ අස්සන් ලබා ගැනීම සඳහා පැමිණි අවස්ථාවේ උන්වහන්සේ මේ බව කීහ.

වංචා, දූෂණ හා අයථා ක්‍රම මගින් නීති විරෝධීව මුදල් උපයන ලද පුද්ගලයන් දේශපාලනයට පිවිස එහි ඇති විවිධ වරප්‍රසාද හා බලය උපයෝගී කර ගනිමින් තව තවත් විසමාචාර හා අපරාධ සිදු කරන බවත් එවැනි පුද්ගලයන් දේශපාලනයට පැමිණීම වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග පක්ෂ නායකයන් විසින් ගන්නේ නම් ගැටලු බොහොමයක් නිතැතින්ම නිරාකරණය වීමේ හැකියාව පවතින බවත් මල්වතු පාර්ශ්වයේ මහ නායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල නාහිමිපාණෝ මෙන්ම අස්ගිරි මහ විහාර පාර්ශ්වයේ මහ නායක අතිපූජ්‍ය ගලගම ශ්‍රී අත්ථදස්සි නාහිමියෝද සඳහන් කළහ.

වර්තමානයේ පවතින මනාප මැතිවරණ ක්‍රමය වෙනස් කර ආසන ක්‍රමය නැවත හඳුන්වා දීමෙන්ද යම් තරමකට දූෂිත පුද්ගලයන් පාර්ලිමේන්තුවට පත්වීම වැළකෙනු ඇති බවද මහ නාහිමිවරු පැවැසූහ.

ඕනෑම රටක උත්තරීතර වූ නීති සම්පාදනය කරන ව්‍යවස්ථාදායකයේ උගත් බුද්ධිමත් අවංක ජනතා සේවයට කැපවූවන් සිටිය යුතු බවද මාර්තු 12 ප්‍රකාශනයට අනුව දේශපාලන පක්ෂ හා නායකයන් කටයුතු කළහොත් යහපත් දේශපාලන සංස්කෘතියක් අප රටේ ස්ථාපිත කිරීම අපහසු නොවන බවද උන්වහන්සේ දෙනම කීහ.

පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා අදහස් දක්වමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගෙන ඒමෙන් පමණක් පවතින දේශපාලන සංස්කෘතිය වෙනස් කළ නොහැකි බවත් දූෂිත, වංචාකාරී, අපරාධවලට සම්බන්ධවූවන්, ස්ත්‍රී දූෂකයන්, දේශපාලන ක්ෂේත්‍රයෙන් මුළුමනින්ම පන්නා දැමීම මාර්තු 12 ප්‍රකාශනයේ අරමුණ බවද සඳහන් කෙළේය.

මේ අවස්ථාවට රවී කන්දගේ, ජාලිය වැලිවත්ත යන මහත්වරුද සහභාගී වූහ.